# සිංහල අධ්‍යයනාංශය

## කොළඹ විශ්වවිද්‍යාලය

ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල අධ්‍යාපනයේ ඉතිහාසය කොළඹ විශ්වවිද්‍යාලය සමඟ බැඳී පවතී. 1921 දී කොළඹ යුනිවර්සිටි කොලීජිය (University College) ආරම්භ කිරීමත්, ඉන්පසුව 1942 දී ලංකා විශ්වවිද්‍යාලය පිහිටුවීමත් සමඟ සිංහල, පාලි, සංස්කෘත යන විෂයයන් පිළිබඳ උසස් අධ්‍යාපනය ආරම්භ විය. 1944 දී ලංකා විශ්වවිද්‍යාලයේ වෙනම සිංහලාංශයක් ස්ථාපනය කරනු ලැබූ අතර එහි ප්‍රථම සිංහල මහාචාර්යවරයා වශයෙන් ආචාර්ය එම්.ඩී. රත්නසූරිය මහතා පත් කරනු ලැබිණි. අනතුරුව, ලංකා විශ්වවිද්‍යාලයේ ශාස්ත්‍ර පීඨය පේරාදෙණියට ගෙන යනු ලැබූ අතර නැවත වරක්, 1963 දී මහාචාර්ය ඇම්.බී. ආරියපාල මහතාගේ මූලිකත්වයෙන් ලංකා විශ්වවිද්‍යාලයේ ශාස්ත්‍ර පීඨයක් කොළඹ ආරම්භ කිරීමත් සමඟ, ඒ යටතේ සිංහල අංශයක් පිහිටුවනු ලැබිණ. අඩසියවසකට වැඩි කාලයක් මුළුල්ලේ කීර්තිමත් ආචාර්යවරුන්ගේ මඟ පෙන්වීම යටතේ උසස් ශාස්ත්‍රාලයීය සම්ප්‍රදායකට හැඩගැසුණු කොළඹ විශ්වවිද්‍යාලයේ සිංහල අධ්‍යයනාංශය, දේශීය හා විදේශීය පශ්චාත් උපාධි සුදුසුකම් සහිත ප්‍රවීණ ආචාර්ය මණ්ඩලයකින් සමන්විත වේ.

# සිංහල අංශයේ ස්ථිර ආචාර්ය මණ්ඩලය




අංශ ප්‍රධාන | සිංහල අංශය
**මහාචාර්ය සඳගෝමි කෝපරහේවා**
බී.ඒ. ගෞරව (කොළඹ), එම්.ඒ. (ලැන්කැස්ටර්),
එම්.ෆිල් (පේරාදෙණිය) පිඑච්.ඩී. (කේම්බ්‍රිජ්)



**මහාචාර්ය ආනන්ද තිස්ස කුමාර**
බී.ඒ. ගෞරව (කොළඹ), පිඑච්.ඩී. (කොළඹ)



**මහාචාර්ය සරත් විජේසූරිය**
බී.ඒ. ගෞරව (කොළඹ), එම්.ෆිල් (කොළඹ)



**මහාචාර්ය පූජ්‍ය අගලකඩ සිරිසුමන හිමි**
බී.ඒ. ගෞරව (කොළඹ), එම්.ෆිල් (කොළඹ)



**ආචාර්ය ලතා ගුරුසිංහ**
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය
බී.ඒ. ගෞරව (කොළඹ), එම්.ෆිල් (කොළඹ)
පිඑච්.ඩී (කොළඹ)



**ආචාර්ය ප්‍රේමසිරි නාගසිංහ -** ජ්‍යෝෂ්ඨ කථිකාචාර්ය
බී.ඒ. ගෞරව (කොළඹ), එම්.ඒ (කැලණිය),
එම්.ෆිල් (කොළඹ), පී.එච්.ඩී. (කැලණිය)



**කුමුදු කරුණාරත්න -** ජ්‍යෝෂ්ඨ කථිකාචාර්ය
බී.ඒ. ගෞරව (කොළඹ), එම්.ඒ (කැලණිය),
එම්.ෆිල් (කොළඹ)



**ක්‍රිශාන්ත ෆෙඩ්රික්ස් -** ජ්‍යෝෂ්ඨ කථිකාචාර්ය
බී.ඒ. ගෞරව (කොළඹ), එම්.ඒ. (කැලණිය)
එම්.ඒ. (කැලිෆෝනියා)



**ජයන්ති බණ්ඩාර -** ජ්‍යෝෂ්ඨ කථිකාචාර්ය
බී.ඒ. ගෞරව (කොළඹ) එම්.ඒ. (කොළඹ)



**ආචාර්ය රංජිත් සේනානායක -** ජ්‍යෝෂ්ඨ කථිකාචාර්ය
බී.ඒ. ගෞරව (රුහුණ), එම්.ෆිල් (පේරාදෙණිය)
පී.එච්.ඩී. (ශ්‍රී'ජපුර)



**කල්‍යාණි විජේසුන්දර -** කථිකාචාර්ය
බී.ඒ. ගෞරව (කොළඹ),එම්. ඒ. (කැලණිය)



**දීපචන්දි අබේසිංහ -** කථිකාචාර්ය
බී.ඒ. ගෞරව (කැලණිය) එම්.ඒ. (කැලණිය)
එම්.ෆිල් (කොළඹ)



**ඔසඳ ගුණරත්න** - කථිකාචාර්ය
බි.ඒ.ගෞරව (කොළඹ) එම්.ඒ.(කොළඹ)



**අචින්ත්‍ය බණ්ඩාර** - කථිකාචාර්ය
බි.ඒ.ගෞරව (කොළඹ) එම්.ඒ. (ටෙක්සාස්)

---

සම්මානිත මහාචාර්යවරු (Emeritus Professors)
සිංහල අධ්‍යයනාංශය



**මහාචාර්ය**
**ජේ. බී. දිසානායක**



**මහාචාර්ය**
**කුසුමා කරුණාරත්න**



**මහාචාර්ය**
**රෝහිණී පරණවිතාන**

# සිංහල ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව

# Master of Arts in Sinhala

සිංහල අධ්‍යයනාංශය
කොළඹ විශ්වවිද්‍යාලය

## හැඳින්වීම

කොළඹ විශ්වවිද්‍යාලයේ සිංහල අධ්‍යයනාංශය මඟින් මේ ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව පවත්වනු ලබන්නේ, ශාස්ත්‍රාලයීය මෙන්ම වෘත්තීය හා අධ්‍යාපන ක්ෂේත්‍රයේ සිංහල භාෂාව හා සාහිත්‍යයේ ප්‍රමිතීන් සහ භාවිතය උසස් තලයකට නැංවීම අපේක්ෂා කරමිනි.එහෙයින් මෙම පශ්චාත් උපාධි පාඨමාලාව හදාරන විද්‍යාර්ථීන්ට, සිංහල භාෂාව හා සාහිත්‍යය ගවේෂණාත්මක ප්‍රවේශයකින් අධ්‍යයනය කිරීමට අවකාශය සැලසෙයි.පාඨමාලා ව්‍යුහය විශේෂයෙන් නිර්මාණය කර ඇත්තේ, සිංහල විෂයයෙහි පශ්චාත් උපාධියක් ලබාගැනීම අරමුණු කරගත් විද්‍යාර්ථීන් පිළිබඳ විශේෂ අවධානයක් යොමු කොට ඔවුන් පර්යේෂණ උපාධියකට සූදානම් කිරීමේ අභිලාෂයෙනි.

## පාඨමාලා අරමුණු

මේ පශ්චාත් උපාධි පාඨමාලාවේ ප්‍රධාන අරමුණු වන්නේ,

- සිංහල භාෂා භාවිතය හා සාහිත්‍ය කෘති ඇගයීමෙහිලා අවශ්‍ය විචාරාත්මක ඥානය හා ශක්‍යතා වර්ධනය කිරීම.
- සිංහල භාෂාව, සාහිත්‍යය හා සංස්කෘතිය සම්බන්ධ සමකාලීන ගැටලු සහ නව ප්‍රවණතා හඳුනාගැනීම සහ අවබෝධය
- සිංහල භාෂාව හා සාහිත්‍යය සම්බන්ධයෙන් ස්වාධීන පර්යේෂණ කටයුතුවල නියුක්ත වීමේ කැමැත්තෙන් සිටින විද්‍යාර්ථීන්ට අවශ්‍ය ශාස්ත්‍රාලයීය ශික්ෂණය සම්පාදනය කිරීම.

## අපේක්ෂිත ප්‍රතිඵල

මේ ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව සාර්ථකව නිම කරන විද්‍යාර්ථියාට පහත සඳහන් ප්‍රතිඵල සාක්ෂාත් කර ගැනීමෙහි අවකාශය සැලසේ.

- සිංහල භාෂාව හා සාහිත්‍ය අධ්‍යයනයෙහි ප්‍රධාන සංකල්ප සහ සන්ධිස්ථාන හඳුනාගනියි.
- සිංහල භාෂා සාහිත්‍ය විෂයයෙහි ප්‍රධාන ගැටලු සහ ප්‍රවණතා හඳුනාගැනීමෙහි හා ඒවා විග්‍රහ කිරීමේ යෙදෙයි.
- සිංහල භාෂාව හා සාහිත්‍යයට අදාළ වන පරිදි පර්යේෂණ ක්‍රමවේද හා න්‍යායාත්මක ප්‍රවේශ සම්බන්ධව අවබෝධය ලබයි.

### පාඨමාලා ව්‍යුහය

කොළඹ විශ්වවිද්‍යාලයීය සිංහල ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව සිංහල භාෂාව, සාහිත්‍යය සහ සංස්කෘතිය පිළිබඳව විශ්ලේෂණාත්මක අධ්‍යයනයක නිරතවීම පිණිස **ඉගැන්වීමේ සංරචකයකින්** (විභාගය සඳහා නියමිත පාඨමාලා ඒකක සතරක් සහ ආධාරක පාඨමාලා ඒකකයක් ද ඇතුළුව) සහ **පර්යේෂණ සංරචකයකින්** (වචන 12,000කට නොඅඩු නිබන්ධනයක්) සමන්විත ය.

## පාඨමාලා අන්තර්ගතය

| | |
|---|---|
| MAS 101: | නූතන සිංහල භාෂා ව්‍යවහාරය |
| MAS 102: | සම්භාව්‍ය සිංහල සාහිත්‍ය අධ්‍යයනය |
| MAS 103: | සමකාලීන සිංහල සාහිත්‍යය හා නාට්‍ය කලාව |
| MAS 104: | සිංහල සංස්කෘතිය හා කලා ශිල්ප |
| MAS 105: | පර්යේෂණ විධික්‍රම හා ශාස්ත්‍රීය ලේඛනය* |
| MAS 106: | නිබන්ධය |

* මෙම පාඨමාලා ඒකකය ආධාරක පාඨමාලාවක් (Support Course) බැවින් ඒ සඳහා ලිඛිත පරීක්ෂණයක් නොපැවැත්වේ.

## මාධ්‍යය

පාඨමාලා මාධ්‍යය ලෙස සිංහල භාෂාව යොදා ගැනෙන අතර, ඊට අදාළ සියලු දේශන, සම්මන්ත්‍රණ සහ වැඩමුළු සිංහල භාෂාවෙන් පැවැත්වෙනු ඇත.

## ඉලක්ක කණ්ඩායම

මේ ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව, තරුණ උපාධිධාරීන්, විශ්වවිද්‍යාලවල කථිකාචාර්යවරුන්, සිංහල ගුරුවරුන්, ජනමාධ්‍යවේදීන්, භාෂා පරිවර්තකයන් හා සිංහල විෂයයෙහි වැඩිදුර අධ්‍යයන හා ගවේෂණ කිරීමට කැමැත්තක් දක්වන විද්‍යාර්ථීන් ඉලක්ක කර ගනී. එසේම, සිංහල පිළිබඳ පර්යේෂණ උපාධියකට සූදානම් වන විද්‍යාර්ථීන්ට ද මේ පාඨමාලාව විශේෂයෙන් වැදගත් වනු ඇත.

## සුදුසුකම්

උක්ත පාඨමාලාව සඳහා සහභාගීවීමට අපේක්ෂා කරන අයදුම්කරුවන් අවම වශයෙන් පහත සුදුසුකම් අතරෙන් එකක් හෝ සපුරා තිබීම අත්‍යවශ්‍ය සේ සැලකේ.

1. පිළිගත් විශ්වවිද්‍යාලයක ඕනෑම විෂය ක්ෂේත්‍රයකින් ප්‍රථම උපාධිය සම්පූර්ණ කර තිබීම.
2. ඉහත (1) වගන්තියට සමාන යැයි කොළඹ විශ්වවිද්‍යාලයීය සනාතන සභාව විසින් පිළිගනු ලබන වෙනත් සුදුසුකම් සපුරා තිබීම.

සියලු අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයක් සඳහා කැඳවනු ලැබේ.

## කාලය

මෙම උපාධි පාඨමාලාව පූර්ණකාලීනව වර්ෂයක කාලයක් පැවැත්වෙන අතර, පැය තුන බැගින් වූ ඉගැන්වීම් සැසි 80කින් (පැය 240) සමන්විත වනු ඇත. අධ්‍යයන වර්ෂය සෙමෙස්තර දෙකකින් යුක්ත ය. රජයේ ප්‍රසිද්ධ නිවාඩු දින හැර සෙනසුරාදා දිනවල පෙ.ව.9.00-4.00 දක්වා, කොළඹ විශ්වවිද්‍යාලයේ සිංහල අධ්‍යයනාංශයේ දී දේශන පැවැත්වේ.

## ඇගයීම් පටිපාටිය

සිංහල ශාස්ත්‍රපති උපාධි පාඨමාලාවේ ඇගයීම් සඳහා, ලිඛිත පරීක්ෂණ (60%), පැවරුම් සතරක් (40%)සහ තම පරීක්ෂක/සම්බන්ධීකාරක සමග සාකච්ඡා කොට තීරණය කර ගන්නා ලද මාතෘකාවක් යටතේ, වචන 12,000 කට නොඅඩු ස්වාධීන පර්යේෂණ නිබන්ධයක් ඉදිරිපත් කිරීම අනිවාර්ය වේ. පළමු සෙමෙස්තරය අවසානයේ දී, MAS 101 හා MAS103 සඳහා ලිඛිත පරීක්ෂණ ද, දෙවන සෙමෙස්තරය අවසානයේ දී, MAS102 හා MAS104 සඳහා ලිඛිත පරීක්ෂණ ද පැවැත් වේ. මෙම සියලු විෂය ඒකක සමත්වීම සඳහා සම්පූර්ණ ලකුණු 100න් අවම වශයෙන් ලකුණු 50ක් ලබාගත යුතුය. පාඨමාලාව උසස් ලෙස සමත් වන අපේක්ෂකයන්ට විශිෂ්ට සාමර්ථ්‍යයක් ලබා ගැනීමේ ඉඩ ප්‍රස්තාව හිමි වෙයි.

සිංහල ශාස්ත්‍රපති පාඨමාලාවේ විශිෂ්ටතම ප්‍රතිඵල ලබා ගන්නා විද්‍යාර්ථියාට **ඩබ්ලියු.ඒ.සිල්වා අනුස්මරණ ත්‍යාගය** උපාධි ප්‍රදානෝත්සවයයේ දී හිමි වනු ඇත.

## දේශක කණ්ඩායම

සිංහල අධ්‍යයනාංශයේ ආචාර්ය මණ්ඩලය සහ ආරාධිත දේශකවරුන් විසින් දේශන පවත්වනු ලැබේ.

## පාඨමාලා ගාස්තු

| | |
|---|---|
| ලියාපදිංචි ගාස්තු | රු. 2,000.00 |
| අධ්‍යයන | රු. 55,000.00 |
| පුස්තකාල | රු. 1,500.00 |
| විභාග ගාස්තු | රු. 1,500.00 |
| එකතුව | රු. 60,000.00 |

පුස්තකාල තැන්පතුව (නැවත ලබා ගත හැකිය) රු. 5,000.00
(එක් කාඩ්පතකට රු. 2500/ බැගින් අනිවාර්ය නොවේ)

## අයදුම් කළ යුතු ආකාරය

කොළඹ විශ්වවිද්‍යාලයේ සිංහල අංශයේ වෙබ් අඩවියෙන් හෝ අධ්‍යයන හා ප්‍රකාශන අංශයෙන් ලබා ගත් අයදුම්පත්‍රය හා ගෙවීම් පත්‍රිකාව නිසි ලෙස සම්පූර්ණ කර, කොළඹ විශ්වවිද්‍යාලයේ යොමු අංක 304010300009 දරන ප්‍රධාන රැස්කිරීමේ ගිණුමට බැර වන ලෙස රු. 1000/- (අයදුම්පත්‍ර ගාස්තුව) ක් ගෙවා එහි ලදුපත ද සමග අයදුම් පත්‍රය අදාළ දිනට පෙර පහත සඳහන් ලිපිනයට යොමු කරන්න.

http://www.cmb.ac.lk/academic/arts/sinhala/index.htm

**සිංහල ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව**
අධ්‍යයන හා ප්‍රකාශන අංශය,
විද්‍යාල මන්දිරය,
කුමාරතුංග මුනිදාස මාවත,
කොළඹ විශ්වවිද්‍යාලය,
කොළඹ 03.

## විමසීම්

**මහාචාර්ය සඳගෝමි කෝපරහේවා**
පාඨමාලා සම්බන්ධීකාරක
සිංහල අංශය, කොළඹ විශ්වවිද්‍යාලය.
දුර. 0112500453 (කාර්යාල) / 0718381142 (ජංගම)

## MAS 101: නූතන සිංහල භාෂා ව්‍යවහාරය
Modern Sinhala Usage

---

### පාඨමාලා අරමුණු

- සිංහල භාෂාවේ ඓතිහාසික සංවර්ධනය හා භාෂා ව්‍යවහාරයේ විවිධත්වය පිළිබඳ මූලික අවබෝධයක් ලබා දීම.
- නූතන සිංහල ලේඛන ව්‍යාකරණ රීති පැහැදිලි කිරීම.
- සිංහල භාෂා ව්‍යවහාරයේ ගැටලු පිළිබඳව වාග්විද්‍යාත්මක පුහුණුවක් ලබා දීම.

### අපේක්ෂිත ප්‍රතිඵල

මේ පාඨමාලාවට සහභාගී වන විද්‍යාර්ථියා,

- සිංහල භාෂාවේ ස්වභාවය හා පාරිණාමික අවස්ථා විස්තර කරයි.
- සිංහල ලේඛන ව්‍යවහාරයේ මූලික රීති අවබෝධ කර ගෙන, සිංහල භාෂා භාවිතයේ පරිචය ලබා ගනියි.
- සිංහල භාෂා විෂයක ගැටලු හා මතවාද වාග්විද්‍යාත්මකව පැහැදිලි කරයි.

### පාඨමාලා නිර්දේශය

1. භාෂාවේ ස්වභාවය හා භාෂා අධ්‍යයනයේ ඉතිහාසය
2. සිංහල ලේඛන ව්‍යවහාරය : සම්භාව්‍ය හා නූතන
3. නිර්දේශාත්මක හා විග්‍රහාත්මක ව්‍යාකරණය
4. සිංහල භාෂාවේ ඓතිහාසික සංවර්ධනය
5. සිංහල අක්ෂර මාලාව හා අක්ෂර වින්‍යාසය
6. පද සාධන රීති
7. වාක්‍ය වින්‍යාස රීති
8. වාක්කෝෂය
9. භාෂා ව්‍යවහාරයේ ගැටලු හා මතවාද
10. සිංහල භාෂාව ඉගැන්වීම.

### ඇගයීම

| | |
|---|---|
| ලිඛිත පැවරුම | 40% |
| අවසාන පරීක්ෂණය | 60% |

## නිර්දේශිත කියවීම්


අභයසිංහ, ඒ. ඒ. **ව්‍යාඛ්‍යාන සහිත සිදත් සඟරාව** කඩවත: අභය මුද්‍රණ ශිල්පියෝ, 1998

කරුණාතිලක, ඩබ්ලිව්. එස්. **සිංහල භාෂාවේ ව්‍යාකරණය** කොළඹ: ගුණසේන, 2001

කුමාරතුංග, මුනිදාස. **ව්‍යාකරණ විවරණය** කොළඹ: එම්. ඩී. ගුණසේන, 1938

කෝපරහේවා, සඳගෝමි. **සිංහල අක්ෂර වින්‍යාස අකාරාදිය** (4 වන සංස්කරණය) කොළඹ: එස්. ගොඩගේ, 2016

——— **භාෂා විමර්ශන ලිපි** කොළඹ: එස්. ගොඩගේ, 2016

——— **විසි වන සියවසේ සිංහල භාෂා ව්‍යවහාරය: සමාජවාග්විද්‍යාත්මක අධ්‍යයනයක්** කොළඹ: එස්. ගොඩගේ, 2010

——— **සිංහල සන්ධි අකාරාදිය** කොළඹ : එස්. ගොඩගේ 2014

——— **සිංහල අකුරු පුරාණය** නුගේගොඩ: සරසවි ප්‍රකාශකයෝ, 2018

දිසානායක, ජේ. බී. **සමකාලීන සිංහල ලේඛන ව්‍යාකරණය - 1 :ව්‍යාකරණ ප්‍රවේශය.** කොළඹ: එස්. ගොඩගේ, 1995

——— **සමකාලීන සිංහල ලේඛන ව්‍යාකරණය - 3 : සන්ධි විග්‍රහය.** කොළඹ: එස්. ගොඩගේ, 1996

——— **සිංහල අක්ෂර විචාරය.** දෙහිවල: සුමිත ප්‍රකාශකයෝ. 2007

——— **සිංහල රීතිය පොත් පෙළ** දෙහිවල : සුමිත ප්‍රකාශකයෝ 2013

——— **නිවැරදි සිංහලය** මහරගම: සුමිත ප්‍රකාශකයෝ. 2018

ධර්මදාස, කේ. එන්. ඕ. **ලේඛනය හා භාෂණය හෙවත් භාෂා ද්විරූපතාව.** කොළඹ, 1999

බලගල්ලේ, විමල් ජී. **සිංහල භාෂාවේ ප්‍රභවය හා ප්‍රවර්ධනය.** කොළඹ: සංස්කෘතික කටයුතු දෙපාර්තුමේන්තුව,1996

——— **භාෂා අධ්‍යයනය හා සිංහල ව්‍යවහාරය.** කොළඹ: එස් ගොඩගේ සහෝදරයෝ, 1995.

**සිංහල ලේඛන රීතිය** මහරගම: ජාතික අධ්‍යාපන ආයතනය, 1989

Atchison, *J. Language Change:Progress or Decay ?*2nd ed. Cambridge: Cambridge University Press, 1991

Crystal, David. *How Language Works.* London: Penguin Books, 2007


(නිර්දේශිත කියවීම් අඩංගු ලේඛන සංහිතාවක් ද සපයනු ලැබේ)

## MAS 102: සම්භාව්‍ය සිංහල සාහිත්‍ය අධ්‍යයනය
Studies in Classical Sinhala Literature

### පාඨමාලා අරමුණු

- සම්භාව්‍ය සිංහල සාහිත්‍යයේ විකාශනය හා ඒ ඒ කාලවලට අයත් සාහිත්‍යයේ සුවිශේෂ ලක්ෂණ පිළිබඳ මූලික දැනුමක් ලබා දීම.
- සමාජ, සංස්කෘතික හා දේශපාලන ප්‍රවණතා සහ සම්භාව්‍ය සාහිත්‍යය අතර පැවති සම්බන්ධතාව ගැන මූලික අවබෝධයක් ලබා දීම.
- නිර්දිෂ්ට ග්‍රන්ථ පිළිබඳ පූර්ණ අවබෝධයක් ලබා දීමෙන් එහි වස්තු විෂය, රචනෝපක්‍රම, සෞන්දර්යාත්මක චින්තනය හා සමාජ ප්‍රශ්න පිළිබඳ වැටහීමක් ලබා දීම.

### අපේක්ෂිත ප්‍රතිඵල

- සම්භාව්‍ය සිංහල සාහිත්‍යයේ ප්‍රවර්ධනය හා සන්ධිස්ථාන පැහැදිලි කරයි.
- පුරාතන සිංහල සාහිත්‍යයේ විකාසනය කෙරෙහි බලපැවැත්වූ සමාජ, සංස්කෘතික පසුබිම හා දේශපාලන ප්‍රවණතා පිළිබඳව විචාරශීලී අධ්‍යයනයක නිරත වේ.
- නිර්දිෂ්ට ග්‍රන්ථ පරිචය තුළින් ඒවායේ වස්තු විෂය, රචනෝපක්‍රම හා සම්ප්‍රදාය පිළිබඳ ලබා ගන්නා පුළුල් අවබෝධය ආශ්‍රයෙන් සම්භාව්‍ය සිංහල සාහිත්‍යයේ ස්වභාවය පැහැදිලි කරයි.

### පාඨමාලා නිර්දේශය

1. සම්භාව්‍ය සිංහල සාහිත්‍යයේ මූලාරම්භය.
2. බෞද්ධාගමික සංකල්ප ප්‍රචලිත කිරීම.
3. බෞද්ධ සාරධර්ම වර්ධනය හා සම්භාව්‍ය සිංහල සාහිත්‍යය.
4. සිංහල පද්‍යයේ ලෞකික මුහුණුවර.
5. සමාජ සංස්කෘතික පසුබිම.
6. කාලීන ප්‍රවණතා හා සිංහල සාහිත්‍යයේ විකාසනය.
7. රචනෝපක්‍රම හා භාෂා භාවිතය.

### ඇගයීම

| | |
|---|---|
| ලිඛිත පැවරුම | 40 % |
| අවසාන පරීක්ෂණය | 60 % |

## නිර්දිෂ්ට ග්‍රන්ථ

- අමාවතුර — ගහපති දමනය, ආලවක දමනය
- බුත්සරණ — නාලාගිරි දමනය, අංගුලිමාල දමනය
- සද්ධර්මරත්නාවලිය, — පන්සියපනස් ජාතක පොත ( තෝරාගත් ජාතක කථා 5 ක් )
- සද්ධර්මාලංකාරය — (පද්මාවතී කථාවස්තුව, තෙභාතික වස්තුව,සාලිරාජ වස්තුව)
- සිගිරි ගී — 1 50 දක්වා පද්‍ය
- කව් සිළුමිණ — 3, 6, 12, 13 සර්ග
- සසදාවත — 1 50 දක්වා පද්‍ය
- ගුත්තිල කාව්‍යය
- හංස සන්දේශය

## නිර්දේශිත කියවීම්


අමරවංශ හිමි, කොත්මලේ **සිංහල සාහිත්‍යලතා** කොළඹ: ගොඩගේ 2000
කුලසූරිය, ආනන්ද **සිංහල සාහිත්‍යය 1** මහරගම : සමන් මුද්‍රණාලය, 1961
——— **සිංහල සාහිත්‍යය 2** මහරගම : සමන් මුද්‍රණාලය, 1963
——— **සිංහල සාහිත්‍යය 3** බොරලැස්ගමුව : විසිදුනු ප්‍රකාශන, 1996
——— **සිංහල සාහිත්‍යය 4** බොරලැස්ගමුව : විසිදුනු ප්‍රකාශන, 1997
ගම්ලත්, සුචරිත **කව්සිළුමිණ විනිස** කොළඹ: ගොඩගේ 1995
——— **සම්භාව්‍ය සිංහල කාව්‍යයේ විකාසනය** කොළඹ ගොඩගේ1998
තිලකරත්න, මිණිවන් **පී. සම්භාව්‍ය සිංහල සාහිත්‍යය හා පොදුජන රුචිය.** කොළඹ: ගොඩගේ, 1984.
වික්‍රමසිංහ, මාර්ටින් **සිංහල සාහිත්‍යයේ නැගීම** දෙහිවල : තිසර ප්‍රකාශකයෝ 1991
විජයවර්ධන, හේමපාල. **සිංහල කාව්‍යය කෙරෙහි සංස්කෘත බලපෑම්.** පරිවර්තනය: රෝහිණී පරණවිතාන. බොරලැස්ගමුව : විසිදුනු ප්‍රකාශකයෝ 1967
සන්නස්ගල, පි. බී. **සිංහල සාහිත්‍ය වංශය** කොළඹ : ලේක්හවුස්, 1961
සුරවීර, ඒ. වී. **සිංහල සාහිත්‍ය සම්ප්‍රදාය.** රාජගිරිය: කුරුළු පොත් 1998
හේවාවසම්, ප. බ. ජී **මාතර යුගයේ සාහිත්‍යධරයන් හා සාහිත්‍ය නිබන්ධන** කොළඹ : සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව 1966


(නිර්දේශිත කියවීම් අඩංගු ලේඛන සංහිතාවක් ද සපයනු ලැබේ)

## MAS 103: සමකාලීන සිංහල සාහිත්‍යය හා නාට්‍ය කලාව
Contemporary Sinhala Literature and Drama

---

### පාඨමාලා අරමුණු

- සමකාලීන සිංහල සාහිත්‍යය හා නාට්‍ය කලාව පිළිබඳ මූලික අවබෝධයක් ලබා දීම.
- සමකාලීන සිංහල සාහිත්‍යයේ හා නාට්‍ය කලාවේ ප්‍රවණතා සහ සන්ධිස්ථාන පිළිබඳ විචාරාත්මක වැටහීමක් ලබා දීම.
- නූතන විචාර මූලධර්ම ආශ්‍රය කර ගෙන සමකාලීන සිංහල සාහිත්‍යාංග හා නවක නිර්මාණ අධ්‍යයනය කිරීමේ පරිචය ලබා දීම.

### අපේක්ෂිත ප්‍රතිඵල

- සමකාලීන සිංහල සාහිත්‍යයේ හා නාට්‍ය කලාවේ මූලික ලක්ෂණ හා පසුබිම පැහැදිලි කරයි.
- සමකාලීන සිංහල සාහිත්‍ය නිර්මාණ පිළිබඳ විචාරාත්මක විමර්ශනයක් සිදු කරයි.
- සිංහල නාට්‍ය කලාවේ සමකාලීන ප්‍රවණතා හඳුනා ගනිමින් නාට්‍ය නිර්මාණ අගය කරයි

### පාඨමාලා නිර්දේශය

1. ප්‍රබන්ධ සාහිත්‍යයේ මූලික ලක්ෂණ
2. ප්‍රබන්ධ සාහිත්‍ය න්‍යාය හා විචාරය
3. සමකාලීන සිංහල ප්‍රබන්ධ සාහිත්‍යයේ සන්ධිස්ථාන
4. නාට්‍ය සිද්ධාන්ත හා සිංහල නාට්‍ය කලාවේ සන්ධිස්ථාන
5. නාට්‍ය රචනය, නිෂ්පාදනය හා නාට්‍ය විචාරය
6. සමකාලීන සිංහල කාව්‍යයේනව ප්‍රවණතා
7. සිංහල සාහිත්‍ය විචාරය පිළිබඳ ගැටලු

### ඇගයීම

| | |
|---|---|
| ලිඛිත පැවරුම | 40% |
| අවසාන පරීක්ෂණය | 60% |

## නිර්දිෂ්ට ග්‍රන්ථ

විරාගය - මාර්ටින් වික්‍රමසිංහ
කරුමක්කාරයෝ - ගුණදාස අමරසේකර
හෙවනැල්ල - සිරි ගුනසිංහ
සෙදෝනා - ඊවා රණවීර
තෝරාගත් සිංහල කෙටිකතා
සිංහබාහු - එදිරිවීර සරච්චන්ද්‍ර
ගජමන් පුවත - දයානන්ද ගුණවර්ධන
සුභ සහ යස - සයිමන් නවගත්තේගම
දුන්න දුනු ගමුවේ - සුගතපාල ද සිල්වා

## නිර්දේශිත කියවීම්


අමරකීර්ති, ලියනගේ. **අමුතු කතාව,** මුල්ලේරියාව: විජේසූරිය ග්‍රන්ථ කේන්ද්‍රය, 2005.
අමරකීර්ති, ලියනගේ. **සභාද සාක්ෂිය,** මුල්ලේරියාව: විජේසූරිය ග්‍රන්ථ කේන්ද්‍රය, 2008.
දිසානායක විමල් **නවකවි සරණිය** කොළඹ: ප්‍රදීප 1978
දිසානායක විමල් **පශ්චාත් නව්‍යවාදය - කෙටි හැඳින්වීමක්** බොරලැස්ගමුව, විසිදුනු 2002
රාජකරුණා, ආරිය **සිංහල නවකථාවේ ආරම්භය** කොළඹ: ගුණසේන 1972
සරච්චන්ද්‍ර, එදිරිවීර **සිංහල නවකථාවේ ඉතිහාසය හා විචාරය** නුගේගොඩ: සරසවි ප්‍රකාශකයෝ 2006
සරච්චන්ද්‍ර, එදිරිවීර. **වෙස් මුහුණ ද සැබෑමුහුණ ද?** (3 වන සංස්කරණය.) කොළඹ, ප්‍රදීප ප්‍රකාශකයෝ,1992
සරච්චන්ද්‍ර, එදිරිවීර. **සිංහල ගැමි නාටකය,** මහරගම: ජාතික අධ්‍යාපන ආයතනය,1992.
සුරවීර ඒ.වී. **සමාජීය සාහිත්‍ය අධ්‍යයනය-** කොළඹ: ලේක්හවුස් 1982
හෝ, ග්‍රැහැම් **සාහිත්‍ය විචාරය** (*An Essay of Criticism* සිංහල පරිවර්තනය රාණි සේනාරත්න රාජපක්ෂ) මුල්ලේරියාව: විජේසූරිය ග්‍රන්ථ කේන්ද්‍රය, 2009

## MAS104: සිංහල සංස්කෘතිය හා කලා ශිල්ප
Sinhala Culture, Arts and Crafts

---

### පාඨමාලාවේ අරමුණු

- සිංහල සමාජය, සංස්කෘතිය හා කලා ශිල්ප පිළිබඳ පුළුල් අවබෝධයක් ලබා දීම.
- සිංහල සංස්කෘතිය හා කලා ශිල්පවල විකාශනය පිළිබඳ තුලනාත්මක දැනුමක් ලබා දීම.
- සිංහල සංස්කෘතිය හා කලා ශිල්පවලට අදාළ ප්‍රායෝගික පුහුණුවක් ලබා දීම.

### අපේක්ෂිත ප්‍රතිඵල

- සිංහල සමාජය, සංස්කෘතිය හා කලා ශිල්පවල ස්වභාවය වටහා ගනියි.
- සිංහල සමාජ සංස්කෘතික සම්ප්‍රදායන් හා කලා ශිල්ප විග්‍රහ කරයි.
- සිංහල සංස්කෘතිය පිළිබඳ ගැටලු විචාරාත්මකව පැහැදිලි කරයි.

### පාඨමාලා නිර්දේශය

1. මානව සමාජය හා සංස්කෘතිය
2. සිංහල සංස්කෘතියේ විකාශනය
3. ආගම, සමාජය හා සංස්කෘතිය
4. සිංහල සමාජ සංවිධානය
5. අභිචාර විධි හා ජන විශ්වාස පද්ධතිය
6. සංස්කෘතික උත්සව
7. සාම්ප්‍රදායික කලාශිල්ප ආරම්භය හා විකාශනය
8. චිත්‍ර, කැටයම් හා ප්‍රතිමා නිර්මාණය හා නව ප්‍රවණතා
9. පැරණි ගොඩනැගිලි වර්ගීකරණය හා අධ්‍යයනය
10. පැරණි වාරි සංස්කෘතිය

### ඇගයීම්

| | |
|---|---|
| ලිඛිත පැවරුම | 40% |
| අවසාන පරීක්ෂණය | 60% |

## නිර්දේශිත කියවීම්


ආරියපාල ඇම් බී, **මධ්‍යකාලීන ලංකා සමාජය** කොළඹ : සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව. 1962

එල්ලාවල, එච්. **පුරාතන ලංකාවේ සමාජ ඉතිහාසය.** කොළඹ : සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව. 1969

කුමාරස්වාමි ආනන්ද, **මධ්‍යකාලීන සිංහල කලා,** කොළඹ : සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව. 1962

චන්ද්‍රා වික්‍රමගමගේ, **ශ්‍රී ලංකාවේ බෞද්ධ ප්‍රතිමා කලාව** කොළඹ : ගොඩගේ සහ සහෝදරයෝ. 2006

——— **ශ්‍රී ලංකාවේ පැරණි ගොඩනැගිලි දොරටු,** කොළඹ : ශ්‍රී ලංකා සංස්කෘතික ශාස්ත්‍රායතනය. 1995

——— **ස්තූප.** කොළඹ :ශ්‍රී ලංකා සංස්කෘතික ශාස්ත්‍රායතනය 1995

පල්ලියගුරු, චන්ද්‍රසිරි, **සංස්කෘතිය සමාජය හා පෞරුෂය.** කර්තෘ ප්‍රකාශන. කොළඹ. 1990

පීරිස් රැල්ෆ්, **සිංහල සමාජ සංවිධානය.** මහරගම, සමන් ප්‍රකාශකයෝ 1964

පෙරේරා සසංක සහ තවත් අය (සංස්කරණය) **ශ්‍රී ලාංකේය සමාජය සහ සංස්කෘතිය පාඨනය කිරීම : තෝරාගත් නිබන්ධ,** කොළඹ : සමාජ සංස්කෘතික තීව්‍ර අධ්‍යයනය සඳහා වන කොළඹ ආයතනය, පළමු වෙළුම (2003)
එම දෙවන වෙළුම (2004)
එම දෙවන වෙළුම (2005)

සෝමතිලක, එම්. **පුරාතන ශ්‍රී ලංකාවේ චිත්‍ර කලාව** කොළඹ :සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව 2004


| |
|---|
| කලා ශිල්ප දේශනවලට අදාළව එක්දින අධ්‍යයන චාරිකාවක් පැවැත්වේ. |

## MAS105: පර්යේෂණ විධික්‍රම හා ශාස්ත්‍රීය ලේඛනය
Research Methods and Academic Writing

### පාඨමාලා අරමුණු

- මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පර්යේෂණවල ස්වභාවය පිළිබඳ මූලික අවබෝධයක් ලබා දීම.
- පර්යේෂණ විධික්‍රම හා පර්යේෂණ ක්‍රියාවලිය පැහැදිලි කර දීම.
- ශාස්ත්‍රීය ලේඛන මූලධර්මවලට අනුකූලව පර්යේෂණ නිබන්ධයක් සකස් කිරීමේ පරිචය ලබා දීම.

### අපේක්ෂිත ප්‍රතිඵල

- පර්යේෂණයක මූලික පියවර හඳුනා ගනිමින් පර්යේෂණ ක්‍රියාවලිය පැහැදිලි කරයි.
- පර්යේෂණ විධික්‍රම භාවිත කරමින් සිංහල අධ්‍යයන ක්ෂේත්‍රයට අදාළ පර්යේෂණ කාර්යයක නිරත වෙයි.
- ශාස්ත්‍රීය ලේඛන කුසලතා දියුණු කර ගනිමින් පර්යේෂණ නිබන්ධනයක් සම්පාදනය කරයි.

### පාඨමාලා නිර්දේශය

1. පර්යේෂණයක ස්වභාවය හා පර්යේෂණ ගැටලුව
2. මානව ශාස්ත්‍ර පර්යේෂණ හා සිංහල අධ්‍යයන ක්ෂේත්‍රය
3. පර්යේෂණ විධික්‍රම
4. ශාස්ත්‍රීය ලේඛන මූලධර්ම හා රචනා විධි
5. පර්යේෂණ යෝජනාවලිය
6. මූලාශ්‍ර වර්ග හා දත්ත රැස් කිරිම
7. නිබන්ධන රචන ක්‍රියාවලිය
8. පර්යේෂණ කාර්යයේ ආචාරධර්මීය ගැටලු

### සැ. යු.

මේ පාඨමාලාව සඳහා අවසාන විභාගයක් හෝ පැවරුම් මාර්ගයෙන් ඇගයීමක් සිදු නොවුවත්, **75%ක දේශන සහභාගිත්වයක්** සහ පාඨමාලාවසානයේ **පර්යේෂණ යෝජනාවලියක් (Research Proposal)** ඉදිරිපත් කිරිම අනිවාර්ය වේ.

## වැඩිදුර කියැවීම


උයන්ගොඩ, ජයදේව. **සමාජීය විද්‍යා පර්යේෂණ යෝජනාවලියක් ලිවීම; න්‍යාය හා ප්‍රායෝගික මගපෙන්වීමක්** කොළඹ සමාජ විද්‍යාඥයින්ගේ සංගමය, 2011.

කෝපරහේවා, සඳගෝමි. **ශාස්ත්‍රීය ලේඛනයක මූලාශ්‍රය දැක්වීමේ විධික්‍රම** (ශාස්ත්‍රීය ලේඛන මූලධර්ම 1) කොළඹ: එස්. ගොඩගේ, 2006.

පෙරේරා, සසංක. **සමාජීය විද්‍යාවන් ලිවීම රචනා සම්ප්‍රදායන් හා ආචාරධර්ම පිළිබඳ කෙටි හැඳින්වීමක්** කොළඹ : ජනවාර්ගික අධ්‍යයන සඳහා වූ ජාත්‍යන්තර කේන්ද්‍රය, 1996.

ලංකාගේ, ජයසිරි. **ශාස්ත්‍රීය උපාධි නිබන්ධන සම්පාදනයට උපදෙස්** කොළඹ: ගොඩගේ 1986.

Murray, Rowena *How to Write a Thesis* London: Open University Press, 2002.

Paul, Oliver *Writing Your Thesis* New Delhi: Sage, 2004.

Taylor, Gordon *The Student's Writing Guide* Cambridge: Cambridge University Press, 2004.

Walliman, Nicholas, *Your Research Project* 2nd. ed. New Delhi : Vistaar Pub., 2005.

# සටහන්